


SDB බැංකුව

#ඔබවවටින

# ඔබව වටින අපේ දැක්ම



ග්‍රාමීය ජන ජීවිත ආර්ථිකමය වශයෙන් ස්ථාවරත්වයට පත් කරමින් ඔවුන්ගේ ජීවිත වටිනාකම්වලින් සාරවත් කරලීම උදෙසා ගොඩනැගුණු අප, සාර්ථකත්වයේ වටිනාකම් රැසක් පිරිවරාගත් දේශයේ පෙරගමන්කරුයි. එවන් වු අප එදා මෙන් අදත්, අද මෙන් හෙටත් වෙහෙසෙන්නේ ධෛර්යය ශක්තිය පොළිබැඳගත් ඔබේ සුවහසක් බලාපොරොත්තු සාක්ෂාත් කරලවීම උදෙසා ඔබට අවැසි වූ ආර්ථිකමය සවිශක්තියත් උපදේශන සේවාවත් නිරන්තරයෙන් ලබාදීමටයි. ඒ මහඟු මෙහෙවර නිසාවෙන් අද වනවිට සමුපකාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා බවට පත්වසිටින අප, ඉදිරියටත් එකී කාර්යභාරය නොපිරිහෙළා ඉටුකිරීම අපගේ මූලික පරමාර්ථයයි.

# පෙළගැස්ම

1. පෙරගමනක පිය සටහන්...

2. සේවා වගතුග පිළිබඳ කතාබස්...

3. අභියෝග අබිබවන්නට ගුරුහරුකම්...

4. සේවයෙන් කැපවෙන්නට පෙරහුරුකම්...

5. තැන්පතු ප්‍රවර්ධනයට දැනමුතුකම්...

6. සාරවත් පිවිසුම් පිළිබඳ විමසුම්...

7. සේවය අගයන හරසර පිදුම්...

8. දේශය වෙනුවෙන් සපුරන යුතුකම්...

9. සෙසු තතු සමග ඇරඹුම්...

10. පැසසුම්...




# පෙරගමනක මං සලකුණු

ශ්‍රී ලාංකේය ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, සමුපකාර සහ ග්‍රාමීය ආර්ථිකය යන ක්ෂේත්‍රයන් විප්ලවීය වෙනසකට පාත්‍ර කළ **SDB** බැංකුව, වසර 25ක් පසු කරමින් ඉදිරියට පියනගන්නේ සුවහසක් ජනතාවගේ ඉමහත් ආදරයත් ශ්‍රී ලාංකේය මෙන්ම ජාත්‍යන්තර ජයග්‍රහණත්, සම්මානත් සහ ඇගයීම් බොහෝමයකුත් අත්පත් කරගෙනයි. ගම් දනව් පුරා ජීවත්වන වැසියන්ගේ ජීවිතවල සුබසිද්ධිය මූලික පරමාර්ථය කරගනිමින් ගොඩනැගුණු සණස ව්‍යාපාරය හා බැඳුණු සුවහසකගේ ආර්ථිකය සුබිත මුදිත කිරීම උදෙසා 1997 දී සණස සමිති හා අනුබද්ධව මූලාරම්භය සනිටුහන් කළ සණස සංවර්ධන බැංකුව, එදාට වඩා අද ලාංකේය ජන සමාජය තුළ පුළුල් අවකාශයක් පුරා විහිදුවාලූයේ **SDB** බැංකුව ලෙසින් ස්ථාවරත්වයට පත්වෙමිනි. ග්‍රාමීය ජනතාවගේ ශක්තිය පාදක කොටගත් සමුපකාර සමිති හරහා මූලික ප්‍රාග්ධනය ගොඩනගාගත් **SDB** බැංකුව උපායමාර්ගික සැලසුම් අනුගමනය කරමින් සමුපකාර ජාලයේ මූල්‍ය අවශ්‍යතාවන් ඉටු කරලීම සඳහා විකල්ප බැංකු සහකරුවකු සහ ප්‍රාථමික ණය ආයතනයක අවශ්‍යතා ඉටු කරන්නට මනාව සමත්විය. එලෙසින් ජනතාව සවිමත් කරමින් ඔවුන්ගේ ශක්තියෙන්ම නැගීසිටි **SDB** බැංකුව, සිය ප්‍රථම කාර්යභාරය කරගෙන ඇත්තේ ද ජන ජීවිත ඉහළ නංවාලීමයි. ඒ වෙනුවෙන් ශ්‍රී ලංකාව පුරා විහිදුණු ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශක්තිමත් කරමින් සිදුකරන මෙරට ආර්ථික සංවර්ධන මෙහෙවර ඒ බව මනාව විදහාපායි. එසේම ග්‍රාමීය කර්මාන්ත සඳහා මෙරට කාන්තා සහභාගිත්වය ඉහළ යෑමට ද තුඩු දුන්නේ **SDB** බැංකුව දියත් කරන ලද කාන්තා ව්‍යවසායකත්වය ගොඩනැංවීම මූලික කරගත් විශාල වැඩපිළිවෙළයි.

එලෙසින් අප කළ කී දෑ සියල්ලක්ම පාහේ ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සහ දේශීය මූල්‍ය ස්ථාවරත්වය ඇති කිරීම සඳහා ඉවහල් වූ බව මනාව කියාපාන්නේ අප ලද දෙස් විදෙස් සම්මාන රැසයි. ඒ අතරින් සුවිශේෂී වන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයේ මික්ස් මාර්කට් ග්ලෝබල් - 2010 හි ලොව හොඳම ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අතරින් දෙවන ස්ථානයට හිමි සම්මානය දිනාගැනීම සහ එක්සත් රාජධානියේ ගෝලීය බැංකු සහ මූල්‍ය සමාලෝචනය 2018 හි වේගවත්ම වර්ධනයක් සහිත ශ්‍රී ලාංකේය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව බැංකුවට හිමි සම්මානය දිනාගැනීමයි. එසේම සම්මානයන්ට එහා යමින් 2017 වර්ෂයේ දී **SDB** බැංකුව අත්පත් කරගත් විශිෂ්ටතම විජයග්‍රහණය ලෙස **SBI** සමාගම, ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව සහ නෙදර්ලන්ත මූල්‍ය සංවර්ධන ආයතනය යන ඉහළ පෙළේ ගෝලීය සමාගම් ත්‍රිත්වය විසින් ඇමරිකානු ඩොලර් මිලියන 22ක ආයෝජනයක් සිදු කිරීම පෙන්වාදිය හැකියි. එය **SDB** බැංකුවේ සේවා වපසරිය ඉතා පුළුල් අන්දමින් ප්‍රවර්ධනය කරගැනීමට ඉඩහසර ලබාදුන් හොඳම ආයෝජන අවස්ථාවයි. වර්තමානය වනවිට ශ්‍රී ලාංකේය ප්‍රධාන බැංකු හා සමානවම ග්‍රාමීය සහ නාගරික ගනුදෙනුකරුවන්ගේ ජීවන රටාව වඩාත් පහසු සහ කාර්යක්ෂම කරලීම උදෙසා **SDB** බැංකුව, ඩිජිටල් බැංකුකරණය සහ නවෝත්පාදනය සමග අත්වැල් බැඳගනිමින් ඔජ්හ ඇප් මෘදුකාංගය වැනි නව ඩිජිටල් ගෙවීම් පහසුකම් ද නව වෙළෙඳ මධ්‍යස්ථාන සේවාවන් ද නව ඩිජිටල් බැංකුකරණ නිෂ්පාදනයන් ද හඳුන්වාදෙන්නට කටයුතු කළේය.

එවන් වටපිටාවක් තුළ දිවයින පුරා විහිදුණු ශාඛා ජාලයකින් ද සවිමත්ව මෙරට ප්‍රමුඛතම බැංකුවලින් එකක් ලෙස සැමදෙනාගේම පිළිගැනීමට ලක්ව ඇති **SDB** බැංකුව, එදා මෙන් අදත්, අද මෙන් හෙටත්, ඉන් ඉදිරියටත් සිය සේවාදායකයින්ට උපරිම සේවාවක් ලබාදීමට බැඳී සිටින "ඔබව වටින බැංකුවයි".



# සේවා වගතුග පිළිබඳ කතාබහක්

**ග්‍රාමීය ජනතාවගේ සුබසිද්ධිය උදෙසා මනා සැලසුමකින් යුක්තව දවසින් දවස ප්‍රවර්ධනය කරගත්තා වූ අපගේ සේවා සහ නිෂ්පාදන පිළිබඳව දැනුවත් කිරීම" SDB බැංකුවේ සමුපකාර අංශ ප්‍රධානී හා සමුපකාර අංශයේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදු කෙරිණ.**



**2022.09.07 වන දින ජාතික සමුපකාර කොමසාරිස්තුමා හා පැවති සේවා පිළිබඳ දැනුවත් කිරීමේ හමුව.**

මෙම අවස්ථාව සඳහා ජාතික කොමසාරිස්තුමා සහ නියෝජ්‍ය කොමසාරිස්තුමා ද සහභාගි විය.



**ජාතික සමුපකාර කොමසාරිස්තුමා හා පැවති සේවා පිළිබඳ දැනුවත් කිරීමේ හමුව.**

මෙම අවස්ථාවට ජාතික සමුපකාර මණ්ඩලයේ සභාපතිතුමා ද ග්‍රාමීය බැංකු සංගමයේ සභාපතිතුමා SDB බැංකුවේ සභාපතිතුමා ද සහභාගි විය.



**වයඹ පළාත් සමුපකාර කොමසාරිස්තුමා හා පැවති සේවා පිළිබඳ දැනුවත් කිරීමේ හමුව.**

මෙම අවස්ථාවට නියෝජ්‍ය කොමසාරිස්තුමිය හා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි විය.



**මධ්‍යම පළාත් සමුපකාර කොමසාරිස්තුමා හා පැවති සේවා පිළිබඳ දැනුවත් කිරීමේ හමුව.**

මෙම අවස්ථාවට නියෝජ්‍ය කොමසාරිස්තුමිය හා දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් සහභාගි වූ අතර අනකෙුත් නිලධාරීන් ZOOM තාක්ෂණය ඔස්සේ සම්බන්ධ විය.



**උතුරු පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් තුමා හා පැවති සේවා පිළිබඳ දැනුවත් කිරීමේ හමුව...**



**නැගෙනහිර පළාතේ සමුපකාර සමිති හා පැවති සමුපකාර ක්‍රියාකාරකම් පිළිබඳව දැනුවත් කිරීමේ හමුව...**

මෙම අවස්ථා සඳහා මුතූර් විවිධසේවා සමුපකාර සමිතිය සහ සයින්දරුදු විවිධසේවා සමිතයේ පිරිස් සහභාගි විය



**උතුරු පළාතේ සණස සමිති හා අනෙකුත් සමුපකාර සමිති හා පැවති සමුපකාර ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීමේ හමුව...**



**වයඹ පළාතේ ග්‍රාමීය බැංකු සංගමයේ සභාපති හා නිලධාරීන් සමග පැවති සේවාවන් පිළිබඳ දැනුවත් කිරීමේ හමුව...**

මම අවස්ථාවට වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී, සමුපකාර අංශ ප්‍රධානී, ශාඛා මෙහෙයුම් ප්‍රධානී, වයඹ කලාප ප්‍රධානී, සමුපකාර අංශ නියෝජ්‍ය කළමනාකරුවන් හා ශාඛාකළමනාකරුවන් සහභාගි විය.



**නිකවැරටිය සණස සමිති සංගමයේ සභාපති සහ නිලධාරීන් අතර පැවති SDB බැංකුවේ සමුපකාර දිශානතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවේ පළමු හමුව...**


මෙම අවස්ථාව සඳහා වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී, සමුපකාර අංශ ප්‍රධානී, ශාඛා මෙහෙයුම් ප්‍රධානී, වයඹ කලාප ප්‍රධානී, වයඹ සමුපකාර කලාප ප්‍රධානී, සමුපකාර අංශයේ නියෝජ්‍ය කළමනාකරුවන් හා ශාඛා කළමනාකරුවන් සහභාගි විය.



**උතුරු පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් තුමා හා සමුපකාර සමිති සමග පැවති සේවා පිළිබඳ දැනුවත් කිරීමේ හමුව..**


# අභියෝග අභිබවන ප්‍රවර්ධන මංපෙත්...

**රට තුළ පැවති ආර්ථිකමය වටපිටාව තුළ මූල්‍ය ක්ෂේත්‍රයට සහ ග්‍රාමීය ප්‍රජාවට මුහුණදීමට සිදු වූඅභියෝගවලට නිසි සූදානමකින් යුතුව මුහුණ දෙන්නේ කෙසේද යන්න පිළිබඳවත් ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන ආකාරය පිළිබඳවත් ඒවාට ගන්නා පියවර මොනවාද යන්න පිළිබඳ කතිකා කිරීමටත් ඒවා ක්‍රියාත්මක කිරීමටත් SDB බැංකුවට හැකිවිය.**




**වයඹ පළාතේ සණස සමිතීන් හි සමුපකාර ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම උදෙසා පැවැත්වූ සාකච්ඡාමය වැඩසටහන...**

මෙම අවස්ථාව සඳහා වයඹ පළාතේ සණස සමිති හා CA Sri Lanka ආයතනයේ ME task Force හි නිලධාරීන් සහභාගි විය.




**බස්නාහිර 11 කලාපය තුළ ZOOM තාක්ෂණය ඔස්සේ පැවති සණස සමිති ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන ආකාරය පිළිබඳ වූ සාකච්ඡාමය වැඩසටහන...**

මෙම අවස්ථාව සඳහා මධ්‍යම කලාපයේ කලාප ප්‍රධානී විසින් සම්පත් දායකත්වය ලබාදුණි.



**2022 වසරේ ඔක්තෝබර් මස 04 වන දින අම්බලන්ගොඩ සණස සමිති සඳහා පැවති සම්මන්ත්‍රණය...**

මෙම සම්මන්ත්‍රණය, ආර්ථික අභියෝග ජයගැනීම සඳහා කළ යුත්තේ කුමක්ද යන තේමාව යටතේ පවත්වන්නට යෙදුණි.



**වයඹ පළාත තුළ සහ සබරගමුව පළාත තුළ පැවති සණස සමිතීන් හි ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන ආකාරය පිළිබඳව වූ සාකච්ඡාමය වැඩසටහන...**

මෙම අවස්ථාවට සමුපකාර අංශයේ නිළධාරීන් හා ශාඛා කළමනාකරුවන් සහභාගි විය.



**නිකවැරටිය සණස සංගම සමග පැවති SAAP ණය යෝජනා ක්‍රමය පිළිබඳව සාකච් කිරීමේ වැඩසටහන...**



**සකසුරුවම් මාසයේ තැන්පතු ඉලක්ක කරගනිමින් දකුණු පළාතේ පැවති සණස සමිති ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන ආකාරය පිළිබඳ වූ සාකච්ඡාමය වැඩසටහන...**

# සේවයෙන් කැපවෙන්නට පෙරහුරුකම්...

**බාධක අභියෝග මැද ගෙවීයන ජන ජීවිතයට අස්වැසිල්ලක් වීම ප්‍රමුඛතම කාර්යභාරය කරගත් අපි, ග්‍රාමීය ජන ජීවිතයට නව මානයන් ගෙන ඒමට ද සෑමවිට උත්සහ ගනිමු. එකී සේවය වෙනුවෙන් සපැමිණෙන අපගේ කාර්ය මණ්ඩලය වෙත ව්‍යාපාරික ඉලක්ක සඳහා අනුගත වන ආකාරය හා ඒ වෙනුවෙන් වන බැහැර ගත ක්‍රියාකාරකම් ආශ්‍රිතව කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීමට හැකිවිය**



### හාරිස්පත්තුව විවිධසේවා සමුපකාර සමිති කාර්යමණ්ඩලය හා පැවති පෙරහුරු වැඩසටහන...

මෙම පුහුණු වැඩසටහන සඳහා සමුපකාර අංශ ප්‍රධානී, වයඹ කලාප ප්‍රධානී, මධ්‍යම කලාප ප්‍රධානී හා මාවනැල්ල ජ්‍යේෂ්ඨ කළමනාකරු, සමුපකාර අංශයේ ජ්‍යේෂ්ඨ කළමනාකරු සම්පත් දායකයන් ලෙස සහභාගි විය.



### බස්නාහිර 11 කලාපයේ දිවුපිටිය විවිධ සේවා සමුපකාර සමිති කාර්ය මණ්ඩලය හා පැවති පෙරහුරු වැඩසටහන...

මෙම පුහුණු වැඩසටහන සඳහා සමූපකාර අංශ ප්‍රධානී, සමුපකාර ණය අංශ ප්‍රධානී සහ බස්නාහිර 11 කලාප ප්‍රධානී සම්පත් දායකයන් ලෙස සහභාගි.



### කටාන විවිධසේවා සමුපකාර සමිති ප්‍රාදේශීය කළමනාකරුවන්ගේ පෙරහුරු වැඩසටහන...

මෙම වැඩසටහන 2022 වසරේ මාර්තු මස 18 වැනි දින පැවැත්වීය.උඩුනුවර හා යටිනුවර විවිධසේවා සමුපකාර සමිති කාර්ය මණ්ඩල



### පෙරහුරු වැඩසටහන...

මෙම වැඩසටහන 2022 වසරේ මාර්තු මස 23 වැනි දින පැවැත්වීය.

# තැන්පතු ප්‍රවර්ධනයට දැනමුතුකම්...

අනාගත සුබසිද්ධිය උදෙසා මෙන්ම මූල්‍ය ස්ථාවරත්වය උදෙසා ඉවහල් වන ඉතිරි කිරීම ප්‍රවර්ධනය කිරීම උදෙසා ග්‍රාමීය ජනතාව උනන්දු කරන්නේ කෙසේද, ඒ සඳහා වන ක්‍රමවේද මොනවාද යන්න පිළිබඳව සේවක මණ්ඩල දැනුවත් කිරීම සිදුවිය.



මහනුවර දිස්ත්‍රික්කයේ පැවති අලුත් අවුරුදු තැන්පතු ප්‍රවර්ධනය පිළිබඳ වූ සාකච්ඡාව...



කෑගල්ල දිස්ත්‍රික් සණස සංගමය සමග පැවති අලුත් අවුරුදු තැන්පතු ප්‍රවර්ධනය පිළිබඳ වූ සාකච්ඡාව...



පිළිමතලාව, උඩුනුවර සහ යටිනුවර යන ප්‍රදේශයන්හි පිහිටි විවිධසේවා සමුපකාර සමිති සමග පැවති අලුත් අවුරුදු තැන්පතු ප්‍රවර්ධනය පිළිබඳ වූ සාකච්ඡාව...

# සාරවත් පිවිසුම් පිළිබඳ විමසුම්...

**සරු දිවිමඟට දිරිදෙමින් දැයේ ගොවිබිම් පුරා විවිධ බෝග වගාවන් ප්‍රවර්ධනය උදෙසා ක්‍රියාත්මක කෙරෙන කෘෂිකාර්මික වැඩසටහන් පෙළක එක් අදියරක් ලෙස මහව, කැත්තපහුව ප්‍රදේශයේ බිම්මල් වගාව සඳහා අත්වැල සහ මඟපෙන්වීම ලබාදෙමින් බොහෝ පිරිසකට වඩා යහපත් හෙට දවසක් උදාකරදීමට SDB බැංකුව පියවර ගෙන ඇත.**



මහව, කැත්තපහුව ප්‍රදේශයේ දිරිය ලියන් වෙත බිම්මල් වගාව පිළිබඳ උපදෙස් සහ මඟපෙන්වීම ලබාදීම මඟින් වඩා සරුසාර ඵලදාවක් සඳහා පසුබිම සැකසීමට කටයුතු කෙරිණි.



බිම්මල් වගාව ආශ්‍රිත කටයුතුවල තත්ත්වය සහ ප්‍රගතිය පරීක්ෂා කරමින් සමස්ත ක්‍රියාවලිය පුරාම විවිධ අයුරින් සහයෝගය ලබාදෙමින් බිම්මල් වගාව වඩාත් ක්‍රමවත්ව කිරීම සඳහා කැප වූ අයුරු.



අදාළ වගාබිම් සහිත ස්ථාන වෙත ගොස් වගාව සඳහා අවශ්‍ය නිසි ප්‍රමිතිය සහිත බිම්මිල් වගා මලු බෙදාදීමට සහ තාක්ෂණික කරුණු පිළිබඳව පිරිස් දැනුවත් කිරීමට පියවර ගැනිණි.



බිම්මල් වගා කටයුතුවල නියැළී සිටින දිරිය ලියන්ගේ උනන්දුව සහ කැපවීම අගයමින් ඔවුන්ට අවශ්‍ය පහසුකම් පිළිබඳව නිරතුරුව සොයා බැලිණි.

# සේවය අගයන හරසර පිදුම්...

නිවැරදි දැක්මක් සහ අරමුණක් ඔස්සේ ක්‍රියාත්මක කෙරෙන විවිධ වැඩසටහන් සාර්ථකව ඉදිරියට ගෙනයාම සඳහා දායකත්වය සපයන පිරිස් ඇගයීම සහ දිරිගැන්වීම අරමුණු කරගනිමින් විවිධ ඇගයුම් හරසර උළෙල සැලසුම් කිරීම සහ පැවැත්වීම SDB බැංකුව විසින් අඛණ්ඩව සිදුකරනු ලබන්නකි.



අකුරැස්ස සණස සමිති උපහාර උළෙල



2022 වසරේ සැප්තැම්බර් මස 28 වන දිනපැවති මාතර සණස සමිති ඇගයීම් උළෙල

# බැතිබර හැඟුමෙන් ඉටුකළ යුතුකම්

යහපත් ආයතනික අරමුණු වෙනුවෙන් නිබඳ කැපවෙමින් ව්‍යාපාර ඉලක්ක සපුරාගන්නා අතරම ආගමික හා සමාජ අභිවෘද්ධිය උදෙසා යුතුකම් හා වගකීම් ඉටුකිරීමටද SDB බැංකුව සැමවිටම කටයුතු කරයි.





**ජනවාරි මස, කුසල් සිත් පෙරදැරිව ඉටුකළ නෙළුම් මල් පූජාව...**

මෙම අවස්ථාව සඳහා සමුපකාර අංශ ප්‍රධානී හා බැංකුවේ කාර්ය මණ්ඩලය සහභාගී විය.

# සෙසු තතු සමග ඇරඹුම්...

වසරින් වසරට, පියවරෙන් පියවර ඉදිරියට යන ජයග්‍රාහී ගමන්මඟ පුරා එකම අරමුණක් වෙනුවෙන් කැපවී දැයේ දසත විසිරී සිය මෙහෙවර ඉටුකිරීමට කැප වූ බොහෝ පිරිසක් සමඟ එක්ව නව ඇරඹුම් ඔස්සේ ජයග්‍රාහී ඉලක්ක සපුරාලීම SDB බැංකුවේ අභිලාෂයයි.



2022 වසරේ ජනවාරි මස 01 වැනි දින වයඹ පළාත් කෘෂි ව්‍යාපාර සමුපකාර සමිතියේ අධ්‍යක්ෂක මණ්ඩලය...



රත්නපුර දිස්ත්‍රික්කයේ විවිධසේවා සමුපකාර සමිති විසිත්ත කිරීමේ වැඩසටහන...



2022 වසරේ පෙබරවාරි මස 08 වන දින ඉංගිරිය විවිධසේවා සමුපකාර සමිතියේ අධ්‍යක්ෂක මණ්ඩලය...

ඔබට
වටින
ඔබව
වටින
බැංකුව

සමුපකාර තැන්පතු සඳහා - මහේන්ද්‍ර රත්මලේ - 0777155184 | සමුපකාර ණය සඳහා - සුමේධා කුමාරආරච්චි - 0778574266 | ඩිජිටල් පහසුකම් සඳහා - අනුරුද්ධ පතිරණ - 0763800553 | විද්‍යුත් ලිපිනය - coop@sdb.lk

SDB බැංකුව

සණස සංවර්ධන බැංකුව පීඑල්සී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණයට ලක් කරනු ලබන බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. Fitch Rating BB+ (Stable), Reg. No: PB62PQ